# 29

# මහනුවර යුගයේ සමාජ විපර්යාසය සාම්ප්‍රදායික චිත්‍ර කලාව කෙරෙහි බලපෑ ආකාරය පිළිබඳ අධ්‍යයනයක් (දූල්වල අලංකාරේ නවකතාව ඇසුරිනි)

*සුභාෂිණී වේරගොඩ, ඩබ්. ඒ. ඩබ්.*[1]

ලක්දිව යටත්විජිත රාජ්‍යයක් බවට පත් වීමෙන් පසු ව මෙරට සමාජ, ආර්ථික, දේශපාලන ආදි වූ සෑම අංගයක ම මෙන් ම චිත්‍ර කලාවේ ද පුළුල් වෙනසක් ඇති වූ නිසා ලක්දිව සාම්ප්‍රදායික චිත්‍ර කලාව ශීඝ්‍රයෙන් පරිහානියට පත්වන්නට විය. අනුරාධපුර යුගයෙන් ආරම්භ වූ ඒ සාම්ප්‍රදායික චිත්‍ර කලාව මහනුවර යුගය වන විට විවිධ වෙනස්කම්වලට භාජන වීමට ප්‍රබල ලෙස බලපෑ හේතුව නම් දහනව වන සියවසේ මෙරට සමාජයේ ප්‍රබල වෙනස්කම් ඇති කළ සාධක වූ මුඩුබිම් පනත, විහාර දේවාලගම් පනත හා යුරෝපීය සංස්කෘතියේ ඍජු බලපෑමයි. 1815න් පසු ව ඇති වූ මෙම සමාජ විපර්යාසයේ වේගය මෙන් ම ප්‍රතිඵලය ද බොහෝ රටවැසියන්ට ඔරොත්තු නොදුන්නේ ය. 2016 වර්ෂයේ රාජ්‍ය සාහිත්‍ය සම්මාන උලෙළේ දී හොඳ ම නවකතාවට හිමි සම්මානයෙන් පිදුම් ලද සුමුදු නිරාගී සෙනෙවිරත්නගේ දූල්වල අලංකාරේ නවකතාවට පසුබිම් වූයේ මෙකී සමාජ තත්ත්වයයි. දේශීය චිත්‍ර කලාව හා සම්බන්ධ පාරම්පරික චිත්‍ර ශිල්පියෙකු වන මෙම නවකතාවේ කථානායකයාට මෙන් ම ඔහුගේ සමකාලීනයන්ට ද මෙම සමාජ විපර්යාසය හේතුවෙන් කලාව රැක ගැනීමත් ජීවන අරගලයත් යන ගැටලු දෙක ම සඳහා සටන් වදින්නට සිදු විය. සිය පාරම්පරික ශිල්ප ඥානය රකින්නට උත්සාහ කළ සෑම ශිල්පයෙකු ම, නව ධනෝපායන මාර්ග සොයා යෑම හා යුරෝපීය කලා ශිල්ප කෙමෙන් ස්ථාපිත වීම යන අභියෝගවලට මුහුණ දී ඇත. මේ සඳහා දූල්වල අලංකාරේ නවකතාව පිළිබඳ අධ්‍යයනයක් කොට එහි ප්‍රතිඵල ලෙස මෙරට සාම්ප්‍රදායික සිතුවම් ආර යටපත් වී යුරෝපීය ආභාසය සහිත ස්වාභාවිකවාදී සිතුවම් කලාවක් ස්ථාපිත වූ ආකාරය දූල්වල අලංකාරේ නවකතාවෙන් කෙතෙක් දුරට නිරූපණය වන්නේ ද යන්න පිළිබඳ ව ගවේෂණය කිරීම මෙම පර්යේෂණයේ අරමුණයි.

ප්‍රමුඛ පදඃ දූල්වල අලංකාරේ, සමාජ විපර්යාසය, චිත්‍ර කලාව, පාරම්පරික ශිල්ප ඥානය, ස්වාභාවිකවාදී සිතුවම් කලාව

*1 ශාස්ත්‍රවේදී (විශේෂ) දෙවන වසර, සිංහල අධ්‍යයනාංශය.*